# 18
# පීඩා මැද

(මැහුම් කර්මාන්තශාලාවක තරුණියන් දෙදෙනෙක් වැඩ කරමින් සිටිති.

| | |
|---|---|
| නයනා | මට හරි මහන්සියි. අද රෑ අපේ පාරේ බස් යන්නේ නෑ. වර්ජනයක් ලු. මට තේරෙන්නේ නෑ අද වැඩ ඇරිලා කොහොම යන්න ද කියලා. |
| කමලා | බස් නැතිවුනොත් ඔයා කොහොම ද ගෙදර යන්නේ. |
| නයනා | කිලෝ මීටර දෙකක් විතර මට පයින් යන්න ම වෙනවා. මේ දවස්වල මම දිගට ම වැඩ කළා. අද නිවාඩුවක් ඉල්ලගෙන කලින් ගෙදර යනවා. මට එක දිගට ම වැඩ කරන්න අමාරුයි. |
| කමලා | හීනයක් නයනා ! අද අපට මේ වැඩ මුරේ සම්පූර්ණ කරන්න ම තියෙනවා. එහා පේලියේ වැඩ කරන විජිතා නිවාඩු ඉල්ලලා පුතාට අසනීප නිසා. එයාට දීලත් නෑ. බලන්න විජිතා මොනතරම් වේදනාවකින් ද ඉන්නේ කියලා. |
| නයනා | මේ මැහුම් වැඩපලේ අපි වහල්ලු වගේ කමලා. අපි මොනව ද මේකට කරන්න ඕනැ. |

අද ලෝකය දෙස බලන කළ සැම තැනක ම හිංසනය, පීඩාවට පත්කිරීම හා ප්‍රචණ්ඩත්වය රජයන බව පෙනේ. එසේ සිදු වීම දේව කැමැත්ත නොවන බව අප වටහා ගත යුතු ය. මන්ද දෙවිඳුන් නිර්මාණය කළ ලෝකය තුළ සැම කෙනෙකුට ම උදාරතර ලෙස ජීවත් වීමට අවශ්‍ය සියලු ම සම්පත් ලෝකය තුළ එතුමන් තබා ඇත.

**සැම පුද්ගලයකුට ම ජීවිතය උදෙසා දෙවිඳුන් සපයා ඇති දේ**

- නිදහස
- ප්‍රීතිය
- මානව අයිතීන්
- දේව සබඳතාවය එකිනෙකා අතර
- එදිනෙදා අවශ්‍යතා සැපිරීම

ගීතාවලිය පරිච්ඡේද 24 හි දක්වන පරිදි පොළොව හා එහි සැම දෙය ද සකල ලෝ වාසීහු ද සව් බලැති හිමිතුමන්ගේ ය. එසේ නම් එතුමන් ලෝකය තුළ ප්‍රචණ්ඩතාවය, හිංසනය හා පීඩනය පැවතීම අනුමත නොකරනු ඇත. එසේ සිදු වන සැම විටම ඒ මැද ක්‍රියා කරමින් මිදී ම සඳහා තමාට අභිමත පරිදි ( අමොස් 9 : 7) කටයුතු කරන බව පෙනේ.

## 1. ඊශ්‍රායෙල් ඉතිහාසයෙන් ...........

නික්මයාම
1,3 පරිච්ඡේදයෙන්

ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ ගත කළ පීඩිත තත්ත්වයෙන් මුදවා ගැනීමේ ක්‍රියාවලියේ වාතාවරණය පෙන්වයි.

- ඊශ්‍රායෙල්වරුන් පීඩාවට ලක්කිරීම

පාරාවෝ
(මිසර පාලනය)

<u>හිංසන ක්‍රම වේදය</u>
හිංසනය
අධික ව වැඩ පැවරීම
බලහත්කාර සේවය
වහල් මෙහෙවර
දරුවන් ඝාතනය (නීතිය)
පවුලක නැතිවීම
ජීවත්වීමේ අයිතිය
එක් ජන කොටසක් නැති කිරීමට
කුමන්ත්‍රණය

ඊශ්‍රායෙල්
ජනතාව

මෙම පැහැදිලි කිරීම තුළ ඊශ්‍රායෙල් ජනතාව ඉතා බරපතල ලෙසට පීඩනයට ලක්කර ඇති බව පෙනේ. දේශපාලන වාතාවරණය හා බලය මිසර පාලකයන් සතු විය. ඉතා දරුණු හිංසන හා පීඩන ක්‍රම වේදයන් මිසරවරු අනුගමනය කළහ. එය ඉතා භයංකර වූ බවත් මුලු ජන කණ්ඩායමක් ම නැති කිරීම සඳහා පාගා දැමීම සඳහා ක්‍රියා කළ බවත් පෙනේ.

පීඩාවෙන් මීදීමට සෙවූ මඟ කුමක් ද යන්න සොයා බැලීම වැදගත් වෙයි පීඩාවේ දී මේ හෙබ්‍රෙව් ජනතාව

- දෙවිඳුන්ට වඩ වඩා කන්නලව් කළහ
- දෙවිඳුන්ට වඩ වඩා මොර ගැසූහ
( නික්මයාම 2 : 24 25 )

නිදහසට පීඩනයෙන් මිදීමට ඔවුන් දෙවිඳුන් කෙරේ තම බලාපොරොත්තු තැබූහ. පීඩාව මැදි දී වඩ වඩාත් දෙවි සමිඳුන්ට ලංවූහ.

● පීඩාවෙන් මුදවා ගැනීමේ කාර්යය දෙවිඳුන් ක්‍රියාත්මක කරන ලදි

" මිසරයේ සිටින මගේ සෙනඟගේ පීඩන තත්ත්වය මම දුටිමි. ඔවුන්ගේ විධායකයන්ට විරුද්ධ ව නගන මොරගැස්මට මම සවන් දුනිමි. ඔවුන්ගේ දුක් වේදනා මම හොඳින් දනිමි. "
නික්ම යාම 3: 7

* මුදවා ගැනීමේ කර්යයේ නායකයා  දෙවියන් වහන්සේ ය. එතුමා පුද්ගලත්වයක් දරන නිසා ජනතාවගේ දුක් තේරුම් ගනී.

* මුදවා ගැනීමේ කාර්යයට නායකත්වය දෙවිඳුන් විසින් තෝරා ගනී. මෝසෙස්, ආරොන් හා ජෝෂුවා විවිධ බාධක අභියෝග පීඩාවන් අතරී මේ සෙනඟ ගෙනයමින් මිදීමේ කාර්යය සඳහා තම කොටස සම්පූර්ණ කරති. ඒ මගදී ආගමික පුනර්ජීවනයක් ඇති විය.

සියල්ල මැද දෙවියන් වහන්සේ පීඩිතයා සමඟ සිට මුදවා ගැනීමේ ක්‍රියාව සම්පූර්ණ කිරීම කරන සේක.

## 2. ජේසුස් වහන්සේගේ ජීවිතය තුළින් ........

" ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද ශුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්නටත්, පීඩිත වුවන් මුදන්නටත්, ස්වාමීන් වහන්සේගේ ප්‍රසාදලත් වසර ප්‍රකාශ කරන්නටත් මා ඒවා වදාළ සේක."
ශු. ලූක් 4 : 18 19

ජේසුස් වහන්සේගේ සේවය හා මෙහෙය දෙස බලන කළ නිතර ම ඒතුමා පීඩිතයන් වෙනුවෙන් ක්‍රියා කළ බව ඔවුන් සමඟ ජීවත් වූ බව හැසිරුණු බව පෙනේ. සමස්ත ලෝකය ම පාපයට බැඳී පීඩිත ව විනාශය කරා යමින් සිටිය දී මුදවා ගැනීමේ කාර්යය කුරුසිය හා උත්ථානය මගින් සම්පූර්ණ කරන ලදී.

**පීඩාවට ලක්වූවන් හා ජේසුස් වහන්සේ**

● එදා සමාජය තුළ විවිධාකාර ලෙස පීඩාවට ලක් ව සිටි ජනතාව ගැන එතුමන්ගේ අවධානය යොමු විය.
● කොන්කරනු ලැබූ කාන්තාවන්ගේ තත්ත්වය උසස් කිරීම.
● ප්‍රතික්ෂේප කරනු ලැබු ජාතීන් සම තත්ත්වයක පිළිගැනීම.
● සමාජ සබඳතාවලින් ඉවත් කළ පුද්ගලයින් / රෝගීන් නැවත සමාජයට පිළිගැනීම.

- සමාජයේ අවධානයට ලක් නොකර සිටි දරුවන්ගේ තත්ත්වය උසස් කිරීම.
- නීතිය තම පෞද්ගලික වාසියට යොදා ගනිමින් පීඩාවට ලක්කළා වූ අය වෙනුවෙන් ක්‍රියා කිරීම.
- පහත් කරන ලද වෙනත් ආගමිකයන්.

සමාජය නැමැති පුළුල් පුද්ගල සම්බන්ධතාවයන් පිළිගැනීම හා මානව අයිතීන් සමග ජීවත් වීමේ අවස්ථාව එතුමන් සකස් කළ සේක. යුදෙව් නීති පද්ධතිය අතරේ මේ අය වෙනුවෙන් එතුමා නිදහසේ ගමන් කරමින් නව ආකල්ප එදා සමාජයට ඇතුළු කරන ලදී. මිනිසා ව පීඩාවට ලක්කරනු ලැබීම, එතුමා ප්‍රතික්ෂේප කරමින් ඉන් මුදවාගැනීමේ කටයුත්ත සඳහා පසුබට නොවීය. මේ ආකල්ප තුළින් සමාජය තුළ ජීවත් වන්නටත් ක්‍රියා කරන්නටත් ක්‍රිස්තුස් වහන්සේ මිනිසාට අභියෝග ගෙන එන සේක.

## 3. මුල් කිතුනු සභාව තුළින් ........

මුල් කිතුනු ප්‍රජාව ආගමික, සමාජයීය හා දේශපාලනමය ලෙසින් හිංසන හා පීඩන මැදින් ගමන් කළහ. එක අතකින් රෝම පාලනයන්, අනෙක් අතින් යුදෙව් සමාජය විවිධාකාර ලෙස ක්‍රම වේදයන් මේ සඳහා යොදා ගත්හ. පීඩිත ව පීඩනයෙන් පිරි සිටි පළමු ශත වර්ෂයේ කිතුනුවන්ගේ ජීවිත පැවැත්ම ඔවුන් ඊට මුහුණ දුන් ආකාරය පාවුල් තුමා පිළිබඳ අධ්‍යනය තුළ දී ඔබට දැනට ම ලැබී තිබේ. (එම පාඩම නැවත අධ්‍යනය කරන්න) වේද සාක්ෂි ජීවිතය පීඩනයේ බරපතලභාවය පෙන්වයි.

එසේ වුව ද අවිහිංසා මාර්ගයක ක්‍රිස්තුස් වහන්සේ ඔවුන් ගෙනයමින් පීඩා මැද ජයග්‍රාහී ව සිටින්නට මඟ පාදන ලදි. පීඩාවල දි නොබිය ව කිතුනු අනන්‍යතාවය රකිමින් ඊට මුහුණ දුන්හ. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අත්දැකීම සියළු බාධක මැද හිංසන හා පීඩන මැද ඔවුන් ව ශක්තිමත් කළ අතර ඔවුන් ද පසුබට නොවී සේවය කළ බව පැහැදිලි වෙයි. ජීවමාන ජේසුස් වහන්සේ තම ස්වාමියා හා ගැලවුම් කාරයා ලෙස ලැබූ අත්දැකීම් ඔවුහු නිරන්තරයෙන් දැරූහ. එම කාරණය ජීවතයේ අනිත් සියලු කාරණාවලට ඉහළින් තිබිණි**.**

## 3. නූතන ශ්‍රී ලංකාව තුළ මිනිසා මුහුණ දෙන හිංසන හා පීඩන මොනවා ද?

ස්වාභාවික ව්‍යසන, දේශපාලන පලිගැනීම, මුලික අයිතිවාසිකම් අහිමි කිරීම, නිදහස අහිමි කිරීම, මුදල් මත පදනම් වූ ගමන් රටාවක අතරමං වීම, රැකියාවල අවිනිශ්චිත භාවය, ලිංගිකත්වය අනුව අසාධාරණය, ස්ත්‍රී දූෂණ, දරුවන් අපයෝජනය ,නිදහස් වෙළෙඳ කලාපයේ තරුණියන්, ගෘහ හිංසන, වතු කරයේ ජනතාව සම්බන්ධ ගැටළු, ත්‍රස්තවාදය ........

## පීඩනයෙන් මුදවා ගැනීමට කිතුනු ප්‍රජාවගේ කාර්යභාරය

- යුක්තිය හා සාධාරණත්වය රජ කරවීමට කටයුතු කිරීම. ( නිදසුන් ඒබ්‍රහම් ලින්කන්, මාටින් ලූතර් කිං, මහත්මා ගාන්ධි වැනි අය මෙන් )
- පීඩාව, පීඩක ක්‍රමවේදය, පීඩිතයා හා පීඩකයා ව නිසිලෙස හඳුනා ගැනීම ගැඹුරු අධ්‍යයනය
- පීඩිතයා හා පීඩකයා අතර අතරමැදියකු වීම සමඟි කිරීමේ මෙහෙවර .
- පක්ෂවාදී නොවී ස්වාධීන වීම.
- දිවැස්වර කාර්යභාරය ඉටු කිරීම.
- පීඩාවෙන් ගලවා ගැනීමට සාමූහික මතයක් ගොඩනැංවීම නීති ගරුක සමාජයට නීතිය ස්ථාපන කිරීමට පෙළඹවීම. ( රදගුරු ලක්ෂමන් වික්‍රමසිංහ )
- දේව මඟ පෙන්වීම සොයමින් ඒ මත ( මාර්ග තැනීම ) විකල්ප ඉදිරිපත් කිරීම.
- පීඩිතයා සමඟ මාංශවත් වීම.
- අවිහිංසාවාදී මාර්ග යොදා ගැනීම.

අප ජීවත්වන සමාජය දෙස විමසුම් සහගත ව බලමින් දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හා ගුණාංග මත ක්‍රියා කිරීම ක්‍රිස්තුස් වහන්සේ ඔබෙන් අපේක්ෂා කරන සේක. ක්‍රිස්තුස් වහන්සේ සමඟ තබන පෞද්ගලික සබඳතාවය රැකගනිමින් ධර්මිෂ්ඨකමේ මාර්ගයේ ගමන් කිරීම ඔබේ යුතුකම යි.

අපේ ලෝකය හිංසනයෙන් හා පීඩාවෙන් ගොඩනැගීමට අපට ඇති වගකීම නිසි ලෙසට තේරුම් ගෙන දේව මඟපෙන්වීමෙන් ක්‍රියා කරමු.
මීකා 6 : 8 ගැන ඔබගේ අදහස් කවරේ ද?

**අභියෝගයක්**

" දේශයේ සෙනඟ බලහත්කාරකම්කොට කොල්ලකෑහ. අසරණයාට ද දිළිඳුන්ට ද පීඩා කළහ අයුතු ලෙස විදේශිකයාට බලහත්කාරකම් කළහ. දේශය නාස්ති නොකරනු පිණිස පවුරක් ගොඩනගා දේශය ආරක්ෂා කරනු පිණිස කපොළුවල සිටිය හැකි මිනිසකු මම ඔවුන් අතර සෙවීමි."

එසකියෙල් 22 : 29

❖ **ඇගැයීම :-**

1 ඔබ සමාජය තුළ දකින හිංසන හා පීඩා සඳහන් කරමින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. මෙම වගුව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

| සමාජයීය | ආර්ථික | දේශපාලනමය | සංස්කෘතිමය | ලිංගිකත්ව අනුව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

2. මානව හිමිකම් පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයෙන් අදාල කොටස අධ්‍යනය කරන්න.